දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit - University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2012 පරීක්ෂණය - 2015 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part I 2012 Examination – January/February 2015

සවිසා 2.1 - සම්භාව්‍ය සමාජ විද්‍යා න්‍යායේ පසුකාලීන වර්ධනය
SGYG 2.1 - Post Development in Classical Sociological Theory

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
(පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න)

---

01. විසංවිධානය වූ සමාජය ප්‍රතිසංවිධානය කිරීමේ අවශ්‍යතාවය මත ගොඩනැගුණු විෂයක් ලෙස, සමාජවිද්‍යාත්මක චින්තනයේ ආරම්භය එහි පසුබිම් සාධක ඇසුරින් පැහැදිලි කරන්න.

02. සමාජ පරිණාමය පිළිබඳ ඔගස්ට් කොම්ට් (Auguste Comte) විසින් ඉදිරිපත් කරන ලද අවධි තුනේ රීතිය පිළිබඳ විචාරාත්මක විමසීමක් කරන්න.

03. සමාජවිද්‍යා න්‍යායේ වර්ධනයට හර්බට් ස්පෙන්සර් (Hurbert Spencer) ගෙන් සිදු වූ දායකත්වය ප්‍රමාණය කරන්න.

04. "ආගම වනාහි ධනේශ්වර පංතියේ පැවැත්ම ස්ථාවර කරන්නකි" කාල් මාක්ස්ගේ (Karl Marx) ආගම පිළිබඳ අදහස් ඇසුරින් විමසන්න.

05. "ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම සහ ධනවාදයේ සාරය" (Protestant ethic and the Spirit of Capitalism) යන කෘතිය මගින් ආගම පිළිබඳ මැක්ස් වෙබර් ඉදිරිපත් කරන ලද තර්කය විමසීමට ලක් කරන්න.

06. සියදිවි හානිකර ගැනීම (Suicide) සමාජ සංසිද්ධියක් වන්නේ ද යන්න එමිල් ඩර්කයිම් (Emile Durkheim) ගේ න්‍යායාත්මක අදහස් ඇසුරින් සාකච්ඡා කරන්න.

07. නිලබල ක්‍රමය (Bureaucracy) පිළිබඳ පරමාදර්ශී වර්ගය කොතෙක් දුරට ප්‍රායෝගික වන්නේ ද යන්න ශ්‍රී ලාංකේය සමාජය ඇසුරින් පහදන්න.

08. පහත සඳහන් මාතෘකා දෙකක් (02) සඳහා සටහන් සපයන්න.
   i. තෝටමානය (Totemim)
   ii. යාන්ත්‍රික ඒකාබද්ධතාවය (Mechanical Solidarity) සහ ඓන්ද්‍රීය ඒකාබද්ධතාවය (Organic Solidarity)
   iii. පරාරෝපණය (Alienation)
   iv. සාම්ප්‍රදායික ආධිපත්‍ය (Traditional Authority) සහ නීතිමය ආධිපත්‍ය (Legal Authority)
   v. සාමූහික විඥානය (Collective Conscience)

*******************************